රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

දුරකථන / தொலைபேசி : 011-2696211-13 / Telephone
ෆැක්ස් / பெக்ஸ் : 011-2692158 / Fax
ඊ-මේල් / ஈ-மெயில் : dge@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையதளம் : www.pubad.gov.lk / Website

මගේ අංකය / எனது இல : / My No : EST-6/03/LEA/3162(1)

ඔබේ අංකය / உமது இல : / Your No :

දිනය / திகதி : / Date : 2022.09.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්

**<u>ජ්‍යේෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 සහ 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I) හා බැඳේ.

02. ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව රජයේ වියදමින් විදේශ පුහුණුවක් ලැබූ නිලධරයෙකුට සිය අනිවාර්යය සේවා කාලය පසුව සම්පූර්ණ කිරීමට යටත්ව විදේශ නිවාඩු ලබා ගැනීමට විධිවිධාන සලසා ඇත.

03. එසේ වුව ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I) හි ඡේද අංක 02 යටතේ 'ඇ' වගන්තියෙහි සඳහන් නිලධරයන්ට අනිවාර්යය සේවා කාලයෙන්/ ගිවිසුම්ගත සේවා කාලයෙන් අඩක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණක් මෙම නිවාඩු අයදුම් කිරීම සඳහා විධිවිධාන සලසා ඇත.

04. ඉහත පළමු චක්‍රලේඛය මත ඇතැම් නිලධරයන් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ එකඟතාවය මත විදේශ නිවාඩු ලබා ගැනීමට වීසා අයදුම් කිරීම ඇතුළු මූලික කාර්යයන් ඉටු කර ඇති බව ද ඒ සඳහා ඔවුන් විශාල පිරිවැයක් දරා ඇති බව ද අමාත්‍යාංශය වෙත දැන ගැනීමට ලැබී ඇත.

05. එබැවින් ඔබ අමාත්‍යාංශයේ/පළාත් සභාවේ විදේශ නිවාඩු අනුමත කිරීමේ කමිටුවට හෝ අමාත්‍යාංශ ලේකම්වරයා/පළාත් ප්‍රධාන ලේකම්වරයා වශයෙන් ඔබට හෝ මානව සම්පත් කළමනාකරණය කර ගැනීම සඳහා සෑහීමකට පත් විය හැකි වැඩපිළිවෙළක් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් ගෙන ඇති බවට තහවුරුවන්නේ නම් පමණක් පළමු චක්‍රලේඛය හා සංශෝධිත චක්‍රලේඛය අතර කාලය තුළ විදේශ නිවාඩු ලබා ගැනීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇති නිලධරයන් ඇත්නම් සහ එකී නිලධරයන්ගේ අනිවාර්යය සේවා කාලය/ ගිවිසුම්ගත කාලය ඉතිරි සේවා කාලයෙන් ආවරණය කර ගත හැකි නම් එවැනි අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු 2022.09.26 දිනට පෙර මා වෙත එවන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : pubad.estad6@gmail.com